පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

நிறுவனத்தின் பெயர் : விவசாயத் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குகள் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No: 492

Name Of the institution : Department of Agriculture

Submission Of Observations of Hon. Minister and Steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No .119(4)

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පළමු කොටස 80:00

| අ.අ. | නිරීක්ෂණය | ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|---|
| 01 | අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | අවදානම් ලේඛනයක් අභ්‍යන්තර යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. 2023,2024 සහ 2025 වර්ෂ සඳහා කෘදෙ/අවිග/01/28 අංකයෙන්ද 2026 වර්ෂය සඳහා කෘදෙ/අවිග/01/56 අංකයෙන්ද අවදානම් ලේඛනයන් පවත්වාගෙන යනු ලබයි. |
| 02 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ පිළිතුරු ඉදිරිපත් කරන ලෙස සියළු අධ්‍යක්ෂ ඒකක දැනුවත් කිරමට කටයුතු කර ඇත. (ඇමුණුම 01) |
| 03 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | සමාලෝචිත වර්ෂය තුල විගණන විමසුම් 14ක් සඳහා මසකට වඩා වැඩියෙන් කාලයක් පිළිතුරු ලබාදීමට අපොහොසත් වී තිබුණද සම්පූර්ණ පිළිතුරක් එවීමට ප්‍රමාද වන අවස්ථාවලදී ඒ වෙනුවෙන් තාවකාලික පිළිතුරක් හෝ ගෙන්වා ගැනිමට කටයුතු කල යුතු බවට අදාල නිලධාරින් දැනුවත් කර ඇත. |
| 04 | සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබිණි. | 2023 වර්ෂය තුල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් 03ක් මෙහෙයවා ඇති අතර කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03කදී දෙපාර්තමේන්තුවේ කරුණු සාකච්ඡා කර ඇත. |

| | | |
|---|---|---|
| 05 | සියළු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සියලුම වාහනවල ලියාපදිංචි සහතික ප්‍රධාන කාර්යාලය වෙත ලබාගැනීමට කටයුතු යොදා ඇති බැවින්, තවදුරටත් උප ඒකක සතුව පවතින ලියාපදිංචි සහතික වේ නම් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලෙස මගේ අංක කෘදෙ/ප/2/12(1)/18/1 හා 2025.12.16 දිනැති ලිපිය මඟින් සියලුම අධ්‍යක්ෂවරු දැනුවත් කර ඇත. (ඇමුණුම 02)<br><br>ඒ අනුව තවදුරටත් උප ඒකකවල පවතින ලියාපදිංචි සහතික ගෙන්වා ගැනීමට කටයුතු කරන අතර, ඒවාහි තොරතුරු වාහන දත්ත පද්ධතියට ඇතුළත් කරමින් පවතී.<br><br>තව ද කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හා වෙනත් රජයේ ආයතනවලින් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් පවරාගනිමින් පවතින වාහනවලට අදාළ ලියාපදිංචි සහතික ඒ ඒ ආයතනවලින් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතී.<br><br>ඒ අනුව එක් ලේඛන හා වාහන දත්ත පද්ධතිය පරීක්ෂාකර බලා තවදුරටත් ලියාපදිංචි සහතික නොමැති සියලුම වාහන සඳහා ලියාපදිංචි සහතික ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 06 | සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තූර කර නොතිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පවතින උප ඒකක 14 ක් අතුරින් ඒකක 11 ට අදාළ සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත. ඉතිරි උප ඒකක තුනෙහි පවතින සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර අවසන් බවට තහවුරු කරන ලෙස මගේ අංක කෘදෙ/ප/2/12/1/15/1 හා 2026.04.30 දිනැති ලිපිය මඟින් අදාළ අධ්‍යක්ෂවරුන් වෙතින් විමසීමට කටයුතු කර ඇත. (ඇමුණුම 03) |
| 07 | වාහනයක් ගර්හිත වී මාස 08කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | ✓ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හා 2020.08.28 දිනැති චක්‍රලේඛයේ 13- මු.රෙ.770(4) යටතේ කටයුතු කිරීමේදී පත් කරනු ලබන විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් විසින් ගර්හිත වාහන හඳුනාගැනීම සිදු කරනු ලබයි.<br>✓ එහිදී සුන්බුන් ලෙස පවතින වාහන, ධාවන තත්ත්වයේ නොපවතින ආර්ථික වශයෙන් එලදායි නොවන වාහන , සහ ධාවන තත්ත්වයේ පවතින ආර්ථික වශයෙන් එලදායි වාහන ලෙස වර්ග කිරීමක් සිදු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | | ✓ මුදල් අංශයේ චක්‍රලේඛ අංක 06/2023 හා 2023.12.29 දිනැති චක්‍රලේඛයේ 10.2 අනුව ලංසු කැඳවීමේ ක්‍රමයට වාහන අපහරණය සිදු කල යුතුය.<br>✓ මෙලෙස ලංකාව පුරා ව්‍යාප්ත වී ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගර්හිත වාහනවල තොරතුරු එක්රැස් කරගෙන එකී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ වාහන වෙන්දේසි කිරීමේදී එම කාර්යය මාස 08 වඩා අඩු කාලයකදී සිදු කිරීම තරමක් ප්‍රායෝගිකව අපහසු වන කාර්යයක් බැව් කාරුණිකව දන්වමි.<br><br>ගත් (ගෙන) ලැබූ ක්‍රියාමාර්ග-<br><br>✓ ගර්හිත වාහන අපහරණය කිරීමට අදාළව ගර්හිත තත්ත්වය හඳුනා ගැනීම හැකි ඉක්මණින් සිදු කරන ලෙසට සියළු අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති බැවිද වැඩි දුරටත් දන්වමි. (ඇමුණුම 04) |
| 08 | ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදු වී තිබුණි. | මු.රෙ.500 (2) ප්‍රකාරව අත්තිකාරම් පිට පවත්වාගෙන යනු ලබන එක් එක් කටයුත්තෙහි ලැබීම් හා ගෙවීම් යන දෙකම ඊට නියමිත සීමාවන් ඇතුළත තදේවික අත්තිකාරම් ගිණුම යටතේ ගිණුම් ගත කරනු ලබන අතර මේ හේතුවෙන්, ඒ කටයුත්තේ “මුදල් ගනුදෙනු” භාණ්ඩාගාරයට අදාළ වන තාක් දුරට එක් ගිණුමක් යටතට පත්වන අතර, මු.රෙ.500 (5) ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් කටයුත්තක “මුදල් ගනුදෙනු” භාණ්ඩාගාරයේ පොත්වල සටහන් කරන්නේ අදාළ අත්තිකාරම් ගිණුමට කෙරෙන හර කිරීම් හා බැර කිරීම් වශයෙන් බව දක්වා ඇති බැවින් මුදල් ගනුදෙනු පමණක් භාණ්ඩාගාරයට වාර්තා වන පරිදි අදාළ ගැළපීම් සිදු කර පවතින බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>නමුත්, විගණනයෙන් පෙන්වා දුන් පසු සීමා සංශෝධනයට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ නමුත් නොවැළැක්විය හැකි හේතුවක් නිසාවෙන් සීමා සංශෝධනය සඳහා වූ නියමිත කාල සීමාවට පෙර එනම්, 2024.05.31ට පෙර එම යෝජනා ඉදිරිපත් කිරීමට නොහැකි වූ බැවින් සීමා සංශෝධනය සඳහා එකඟ විය නොහැකි බව දන්වා ඇත. (ඇමුණුම 05) |

| | | |
|---|---|---|
| 09 | මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරිව තිබූ ප්‍රතිපාදන සීමාව ඉක්ම වන පරිදි බැඳීම් බැරකම් වලට එළඹී තිබීම | ජල, විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීම දෛනික කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන බැවින්, මෙම ගෙවීම් කටයුතු සිදු කළ බව කාරුණිකව දන්වා සිටිමි. ජල, විදුලි සහ දුරකථන බිල්පත් ගෙවීම් සිදු කිරීම අත්‍යාවශ්‍ය වන බැවින් සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට බැහැර වෙනත් කාර්යාල වලින් ලැබෙන බිල්පත් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් මෙම ගෙවීම් කටයුතු සිදු කරන ලද අතර, කෙසේ නමුත්, මු.රෙ.94(1) ප්‍රකාරව<br><br>* වාර්ෂික ඇස්තමේන්තු වල මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක්,සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳි සිටීමටත්<br><br>* ඒ වෙනුවෙන් දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවීමටත්,<br><br>* මුදල් ගෙවීමට සිදුවන කාලය වන විට අතිරේක මුදල් ප්‍රතිපාදන ලැබෙයැයි අපේක්ෂාවෙන් වියදම් හෝ බැරකම් නොදැරීමටත් වගබලා ගත යුතු බවට සියළු අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. (ඇමුණුම 06) |
| 10 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | 2025.12.31 දිනට වන විට ජනපද නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාළව වර්ෂ 01කට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ රු.4,037,413.15 පැවතුණි. එයින් 2026.01.01. දින වන විට රු.3,367,140.40 ප්‍රමාණයක් අයවී අවසන් වී ඇත. ඒ අනුව තව දුරටත් අයවීමට පවතින රු.670272.75 ක ණය ශේෂ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇමුණුම 07 මගින් දක්වා ඇත. |
| 11 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් තුළ නිරවුල් කර නොතිබුණි | අත්තිකාරම් ලබා ගන්නා නිලධාරීන්ට තමන් ලබාගත් අත්තිකාරම දින 10ක් තුළ වැඩසටහන නිමවූ වහාම පියවිය යුතු ලෙස අදාළ අධ්‍යක්ෂ වරු මගින් නිරන්තරයෙන් දැනුවත් කිරීම සහ පසුවිපරම් කිරීම සිදුකර ඇත. (ඇමුණුම 08 ) |

| | | |
|---|---|---|
| 12 | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2023 වර්ෂයේ වාර්ෂික පුහුණු සැලැස්ම අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීමට වර්ෂය ආරම්භයේ සංවිධානය කර තිබුණ ද භාණ්ඩාගාර ලේකම්ගේ 1/2023 හා 2023.01.27 දිනැති චක්‍ර ලේඛය අනුව රජයේ වියදම් සීමා කිරීම මත, පුහුණු වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් ලබා දීමට හැකි වූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. |
| 13 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටක්ව මට්ටමේ / ව්‍යාවිත මට්ටමේ /අහිතකර මට්ටමේ විය. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. |
| 14 | සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත දිනට ලබා නොදුන් නිලධාරීන්ගෙන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි. |
| 15 | උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | 1. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය<br>ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සංශෝධිත ස්ථානමාරු පටිපාටිය මගේ අංක ආ/1/10/කෘ.සේ./වා.ස්.මා-2024 හා 2025.11.02 දිනැති ලිපියෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුමැතියට යොමු කර ඇත. ඒ සම්බන්ධව නැවත නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක Agri/2/2/1/4/10/02 කෘ.සේ.ස්.මා හා 2026.01.19 දිනැති ලිපිය මගින් දන්වා ඇති අතර, ඒ සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ලබා දිම සඳහා කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි.<br>2. ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (විශේෂ)<br>කෘෂිකර්ම උපදේශක (විශේෂ) ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනුමත ස්ථානමාරු පටිපාටියක් නොතිබූ අතර, ස්ථානමාරු පටිපාටියක් සකස් කර ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අංක Agri/2/2/1/3/3/1/7-iii හා 2025.08.04 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබාගෙන ඇත.වෘත්තීය සමිති නියෝජිතයන් විසින් තවදුරටත් සංශෝධනය විය යුතු කරුණු පිළිබඳව 2026.03.31 දින යෝජනාවලියක් ඉදිරිපත් කර ඇති අතර අදාළ යෝජනා ස්ථාන මාරු පටිපාටියට ඇතුළත් කළ යුතු ආකාරය පිළිබඳව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| | | 3. තාක්ෂණ සේවය<br>2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය පවත්වා ස්ථාන මාරු යෝජනා ලබාදුන් නමුත් කෘෂිකර්ම උපදේශකවරුන්ගේ වෘත්තිය සංගම් විසින් අධිකරණයේ පැමිණිල්ලක් ගොනු කිරීම හේතුවෙන් නඩුව අවසන් වන තෙක් ස්ථාන මාරු ලබාදීම අත්හිටුවන ලදී.<br><br>එක් එක් සේවා ස්ථාන වල වර්ෂ 05ක සේවා කාලය ඉක්මවූ සියළුම නිලධාරින් ස්ථාන මාරු කිරීම එකවර සිදු කළ නොහැකි අතර, ඒ සඳහා පහත සඳහන් කරුණු හේතු වී ඇති බව කාරුණිකව දන්වමි.<br>I. නිලධාරී පුරප්පාඩු පැවතීම.<br>II. සීමිත නිලධාරින් ප්‍රමාණයකින් උපරිම ධාරිතාවයකින් සේවා ස්ථාන පවත්වා ගැනීමට සිදු වීම.<br>III. ඒ ඒ සේවා ස්ථාන වල දෛනික රාජකාරී බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගැනීම.<br>IV. ඉතා දුෂ්කර හා දුෂ්කර සේවා ස්ථාන සඳහා ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් නොවීම.<br>V. ඇතැම් දුෂ්කර සේවා ස්ථාන සඳහා අනුප්‍රාප්තිකයන් ලබා දීමට නොහැකි වීම හා එවැනි සේවා ස්ථාන වල ඇතැම් නිලධාරින් දුෂ්කර සේවා ස්ථාන වලම සේවය කිරීමට කැමැත්ත පළ කර තිබීම.<br>VI. 2022 වර්ෂයේ ස්ථාන මාරු කෘෂිකර්ම උපදේශක වෘත්තීය සමිති විරෝධතා හේතුවෙන් අවලංගු වීම.<br>VII. 2022/2023 වාර්ෂික ස්ථාන මාරු කෘෂිකර්ම උපදේශක සංගමය මගින් ගොනු කළ අභියාචනාධිකරණ අයදුම්පත හේතුවෙන් තාවකාලිකව අත්හිටුවීම.<br><br>2022 හා 2023 වර්ෂ සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු ඒකාබද්ධ කර වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවා ස්ථාන මාරු නියෝග 2022.10.31 දින නිකුත් කරන ලදී. අදාළ ස්ථාන මාරු නියෝග අනුව කෘෂිකර්ම උපදේශක නිලධාරින් 127 දෙනෙකු ස්ථාන මාරු කරන ලදි. 2022 හා 2023 වර්ෂ සඳහා පර්යේෂණ සහකාර සහ තාක්ෂණ සහායක නිලධාරින්ගේ ස්ථාන මාරු නියෝග 2022.10.31 දිනැතිව නිකුත් කරන ලදී. ඒ අනුව, පර්යේෂණ සහකාර නිලධාරීන් 23 සහ තාක්ෂණ සහායක නිලධාරින් 91 දෙනෙකු ස්ථාන මාරු කරන ලදී. |

නමුත්, කෘෂිකර්ම උපදේශක වෘත්තීය සංගම් විසින් ගරු අභියාචනාධිකරණයේ ගොනු කරන ලද අයදුම්පත හේතුවෙන් අදාළ වාර්ෂික ස්ථාන මාරු කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී.

එම නඩු කටයුතු අවසන්වීම 2024.02.02 දින දක්වා දීර්ඝ වීම හේතුවෙන් 2022 හා 2023 වර්ෂයන් වලට අදාළව සිදු කරන ලද කෘෂිකර්ම උපදේශක නිලධාරින්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර, 2024 වර්ෂයේද මාස දෙකක් අවසන් වී තිබීම නිසා 2024 වර්ෂය සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට ද නොහැකි විය. මෙම නඩු කටයුත්ත හේතුවෙන්, 2024 වර්ෂය සඳහා පර්යේෂණ සහකාර සහ තාක්ෂණ සහායක නිලධාරින්ගේ ස්ථාන මාරු මණ්ඩල ක්‍රියාත්මක කිරීමටද බාධා මතු විය.

නමුත්, මේ වන විට ස්ථාන මාරු පටිපාටියට අනුකූලව නිලධාරින් ස්ථාන මාරු කරමින් මෙම ගැටලු අවම කරගෙන ඇති බව දන්වා සිටිමි.

4. ඒකාබද්ධ සේවය

ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්,රියදුරු සහ කාර්යාල සේවක සේවයේ වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් කටයුතු කරන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසිනි. වාර්ෂික ස්ථානමාරු අයදුම්කරන නිලධරයන්ගේ අයදුම්පත් නිර්දේශ කර මාර්ගගතව යොමු කරන අතර මෙම දෙපාර්තමේන්තුවේ වසර 5කට අධික සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ නාම ලේඛනයද සකස්කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරනු ලැබේ.ඒ අනුව 2024/2025 වර්ෂයේ පහත පරිදි ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක කර ඇත.

| තනතුර | ස්ථාන මාරු ලද සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධන නිලධාරි | 17 |
| කළ.සේ.නි. | 37 |

| | | |
|---|---|---|
| | | රියදුරු 18<br><br>කාර්යාල සේවක සේවය 04<br><br>කළමනාකරණ සේවා නිලධාරි සහ සංවර්ධන නිලධාරි තනතුරුවලට අදාළව දෙපාර්තමේන්තුවේ වාර්ෂික අභ්‍යන්තර ස්ථානමාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීම සඳහා 2024 වර්ෂයේ සිට අනුමැතිය ලැබී ඇත. දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන් ස්ථානමාරු කිරීමේදී විවිධ අධ්‍යක්ෂ අංශයන්ට අදාළ රාජකාරි (කාර්යාත්‍රිය/ ක්ෂේත්‍රග. රාජකාරි) සිදු කරගෙන යාමේදී විෂයානුබද්ධ දැනුම සඳහා එම නිලධරයන් විසින් හදාරා ඇති උපාධිය පිළිබඳ (උදා- කෘෂිකර්ම විද්‍යාවේදී,ආහාර තාක්ෂණය පිළිබඳව, විද්‍යාවේදී ආදී) විශේෂ අවධානය යොමු කරන අතර වෙනත් අධ්‍යක්ෂ අංශ වලින් විශේෂ ප්‍රාගුණ්‍ය සහිත නිලධරයින්ගෙන් තොරව වෙනත් විෂයක් හදාරා ඇති නිලධරයන් ස්ථානමාරු කිරීම මඟින් ප්‍රායෝගික ගැටළු පැන නගින බැවින්, අභ්‍යන්තර ස්ථානමාරු සඳහා අයදුම්කල නිලධරයන් සහ එකම ඒකකයක් තුළ වසර 05ට වැඩි සේවා කාලයක් සපිත නිලධරයන් ද අදාළ ඒකකන්හි රාජකාරි කටයුතුවලට බාධාවක් නොවන පරිදි ස්ථානමාරු කිරීමට කටයුතු කරන ලදි. 2027 වර්ෂයේ අභ්‍යන්තර ස්ථානමාරු අයදුම්පත්‍ර කැඳවීම 2026.06.30 දිනට පෙර සිදු කිරීමට නියමිතය.<br>මෙම දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු වන කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි, වැඩසටහන් සහකාර, ලොව්පල් ලිපිකරු, මාධ්‍ය සහකාර, ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර, නේවාසිකාගාර පාලක/පාලිකා,බිජ කෘෂිකර්ම චිත්‍ර ශිල්පී, ඡායාරූප, ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික, මී මැසි ප්‍රදර්ශක, කෘෂි ව්‍යාප්ති සේවා නිලධාරි සංඛ්‍යාව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 250(II) වගන්තිය පරිදි නිලධාරීන් 50කට වඩා අඩු බැවින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි අභ්‍යන්තර ස්ථානමාරු ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලද නමුත් 2024/2025 වර්ෂ සඳහා කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි තනතුරෙහි නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථානමාරු අයදුම්පත් කැඳවන අතර ස්ථානමාරු පිළිබඳ අභියාචනා කමිටුව රැස්කිරීමට කටයුතු සූදානම් කර ඇත. |

5. ප්‍රාථමික අර්ධ ශිල්පීය හා ශිල්පීය (PL-02/03) හා ප්‍රාථමික ශිල්පීය නොවන (PL-01) සේවා ගණය

ප්‍රාථමික අර්ධ ශිල්පීය හා ශිල්පීය (PL-02/03) හා ප්‍රාථමික ශිල්පීය නොවන (PL-01) සේවා ගණයට අදාල තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිත විධිමත් ස්ථාන මාරු පටිපාටියක් නොතිබූ බැවින් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදය අනුව විධිමත් ස්ථාන මාරු පටිපාටියක් සකස් කර 2023 වර්ෂයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව, 2024 හා 2025/2026 වර්ෂයන්ට අදාලව වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක කර ඇත. ප්‍රාථමික අර්ධ ශිල්පීය හා ශිල්පීය (PL-02/03) හා ප්‍රාථමික ශිල්පීය නොවන(PL-01) තනතුරු වලට අදාලව වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයින්ගේ නාම ලේඛන සකස් කර ස්ථාන මාරු මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර පහත සඳහන් හේතු මත වසර 05 ට වැඩි සියලුම සේවකයින් ස්ථානමාරු කිරීමේ හැකියාව නොතිබුණි.

- වසර 05 ට වැඩි සේවකයින් සියලු දෙනා එකවර ස්ථානමාරු කිරීමෙන් ආයතනික කටයුතු කරගෙන යාමට ගැටලු ඇතිවීම.
- සේවා අවශ්‍යතාවය, තනතුරුවල පුරප්පාඩු පැවතීම යන කරුණු මත අනුප්‍රාප්තිකයින් ගැලපීමේදී ගැටලුකාරී තත්වයන් මතුවීම.

ආචාර්ය ඩබ්.ඒ.ආර්.ටී.වික්‍රමආරච්චි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ආචාර්ය ඩබ්.ඒ.ආර්.ටී. වික්‍රමආරච්චි
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.

ඩී.පී.වික්‍රමසිංහ,
ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.

D.P. Wickramasinghe
Secretary
Ministry of Agriculture, Livestock, Lands & Irrigation
80/5, "Govijana Mandiraya", Rajamalwatta Road
Battaramulla.

ඇමුණුම (01)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்,, பேராதனை.
**Department of Agriculture, Peradeniya.**
මුදල් අංශය. - நிதிப் பிரிவு. - **Finance Division.**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / **My No.** කෘදෙ/මු/8/6/Ad.Letters | ඔබේ අංකය / உமது இல. / **Your No** | දිනය / திகதி / **Date** 2025.09. 24 |

**සියළුම අධ්‍යක්ෂවරු / ප්‍රධාන ගණකාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු,**

**අතිරේක අධ්‍යක්ෂ (ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම්).**

**<u>විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම</u>**

රජයේ විගණන අංශයෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයෙන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන සෑම විගණන විමසුමකම පිළිතුරු ඉදිරිපත් කළ යුතු දිනය සඳහන් කර එවන අතර, එය විගණන විමසුම නිකුත් කළ දින සිට දින 14 ක කාලසීමාවකි. ඒ අනුව, එම දින හෝ එම දිනට පෙර මා විසින් විගණන අංශ වෙත විගණන විමසුම් සඳහා පැහැදිලි පිළිතුරු සනාථන ලේඛන සහිතව ඉදිරිපත් කළ යුතු වේ.

විගණන විමසුම්වලට පිළිතුරු යැවීමේ විෂය ඉංජිනේරු ගිණුම් ශාඛාව මඟින් සිදු කරන අතර, එම ශාඛාව මඟින් අදාළ අධ්‍යක්ෂ ඒකක වෙත විගණන විමසුම් කඩිනමින් යොමු කරනු ලැබේ. එම විගණන විමසුම් සමඟ යොමු කරන ආවරණ ලිපි මඟින් විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කළ යුතු දිනය සඳහන් කරනු ලැබේ.

කෙසේ වෙතත්, අධ්‍යක්ෂ ඒකක විසින් නියමිත දින හෝ එම දිනයට පෙර පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය නිරන්තරයෙන් සිදුවන අතර, එම පිළිතුරු විගණන අංශ වෙත යොමු කිරීමට පෙර පැහැදිලි, නිරවුල් සහ ප්‍රමාණවත් නොවන අවස්ථාවන්වලදී විගණන අංශය වෙත පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදු වී ඇත. අදාළ අධ්‍යක්ෂ විසින් විගණන විමසුම්වලට අදාළව යොමු කරනු ලබන පිළිතුරු ගණකාධිකාරී (ඉංජිනේරු ගිණුම්), ප්‍රධාන ගණකාධිකාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් පරීක්ෂා කර මා වෙත යොමු කරනු ලැබුවද, විගණන විමසුම මඟින් අනාවරණය කරනු ලබන තාක්ෂණික කරුණු සම්බන්ධව පිළිතුරු සකස් කර ඉදිරිපත් කිරීම ගැටළුකාරී වේ.

එබැවින්, නියමිත දිනට පෙර විගණන විමසුම් සඳහා පිළිතුරු තම අධ්‍යක්ෂ ඒකකය අයත්වන අදාළ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මඟින් ඉදිරිපත් කිරීමෙන් විගණන විමසුම සඳහා තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් නිවැරදි පිළිතුරක් යැවිය හැකි වන අතර, සිදුවන කාල ප්‍රමාදයන් ද වළක්වා ගත හැකි වනු ඇත.

තවද, පාර්ලිමේන්තුව විසින් දෙපාර්තමේන්තුව පිළිබඳව වාර්ෂිකව සිදුකරන ඇගයීම් වාර්තාවේ දී විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේ කාර්යක්ෂමතාවය පිළිබඳව විමසා සිටින බැවින්, විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සළකා සෑම විගණන විමසුමක් සඳහාම වන පැහැදිලි පිළිතුරු තම අධ්‍යක්ෂ ඒකකය අයත්වන අදාළ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මඟින් ඉංජිනේරු ගිණුම් ශාඛාව වෙත කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ආචාර්ය ඩබ්.ඒ.ආර්.ටී. වික්‍රමආරච්චි
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.

ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්.ටී.වික්‍රමආරච්චි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :

01. අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) / (පර්යේෂණ) / (පාලන) - අ.ක.ස.

තැ.පෙ.අංක 1, පරණ ගලහ පාර, පේරාදෙණිය - 081-2388331/32/34 ෆැක්ස් : - 081 -2388149

01-අ

33

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம், பேராதனை.
Department of Agriculture, Peradeniya.
මුදල් අංශය. - நிதிப் பிரிவு. - Finance Division.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. කෘදෙ/මු/8/6/ර.ගි.කා.ස. | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2024.07.30 |

සියළුම අධ්‍යක්ෂවරු / ප්‍රධාන ගණකාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු,

අතිරේක අධ්‍යක්ෂ (ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම්).

## විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම

විගණකාධිපති විසින් සෑම විගණන විමසුමක්ම මා වෙත යොමු කරනු ලබන්නේ, පිළිතුරු ඉදිරිපත් කළ යුතු දිනය සඳහන් කරමිනි. ඒ අනුව, එම දින හෝ එම දිනට පෙර මා විසින් විගණකාධිපති වෙත විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කළ යුතු වේ.

විගණන විමසුම් වලට පිළිතුරු යැවීමේ විෂය ඉංජිනේරු ගිණුම් ශාඛාව මඟින් සිදු කරන අතර, එම ශාඛාව මඟින් අදාළ අධ්‍යක්ෂ ඒකක වෙත විගණන විමසුම් කඩිනමින් යොමු කරනු ලැබේ. එම විගණන විමසුම් සමඟ යොමු කරන ආවරණ ලිපි මඟින් විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කළ යුතු දිනය සඳහන් කරනු ලැබේ.

එසේ වෙතත්, අධ්‍යක්ෂ ඒකක විසින් නියමිත දින හෝ එම දිනයට පෙර පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය නිරන්තරයෙන් සිදුවන බැවින්, විගණන විමසුම් සඳහා විගණකාධිපති වෙත පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාදයට පත් වී ඇත. පාර්ලිමේන්තුව විසින් දෙපාර්තමේන්තුව පිළිබඳව වාර්ෂිකව සිදුකරන ඇගයීම් වාර්තාවේ දී විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේ කාර්යක්ෂමතාවය පිළිබඳව විමසා සිටින බැවින්, විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සළකා සෑම විගණන විමසුමක් සඳහාම වන පැහැදිලි පිළිතුරු ඉංජිනේරු ගිණුම් ශාඛාව වෙත කඩිනමින් යොමු කිරීමට අවශ්‍ය විධිවිධාන සළසා ගන්නා මෙන් දන්වමි.

K-R-S

කේ.එන්.එස්.රණතුංග,

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

කේ. එන්. එස්. රණතුංග
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.

පිටපත් :

01. අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), (පර්යේෂණ) / අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
02. ප්‍රධාන මූල්‍ය නිලධාරී
03. විගණන අධිකාරී

ඇමුණුම (02) 113 (38)

මගේ අංකය - කෘදෙ/ප/2/12(1)/18/1
පාලන 02 ශාඛාව,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය

2025.12. 16

සියලුම අධ්‍යක්ෂවරු/ප්‍රධාන ගණකාධිකාරී/ප්‍රධාන ඉංජිනේරු,

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ භාවිතා කරනු ලබන වාහනවල ලියාපදිංචි සහතික ප්‍රධාන කාර්යාලය වෙත ලබාගැනීම

ඉහත කරුණ සම්බන්ධයෙන් සියලුම ඒකක ප්‍රධානීන් අමතා නිකුත් කළ මගේ අංක කෘදෙ/ප/2/12/1/5 හා 2020.08.21 දිනැති ලිපිය හා බැඳේ. (ඇමුණුම 01) —— (36)

02. එකී ලිපිය ප්‍රකාර ව මෙම දෙපාර්තමේන්තුවේ උප ඒකක විසින් භාවිතා කරනු ලබන වාහනවලට අදාළ ලියාපදිංචි සහතික බොහෝ ප්‍රමාණයක් පාලන 02 ශාඛාව වෙත යොමු කර තිබුණ ද ඇතැම් වාහනවල ලියාපදිංචි සහතික තවදුරටත් අදාළ උප ඒකකයේ ම පවතින බව නිරීක්ෂණය වී ඇත.

03. ජාතික (37) විගණන උප කාර්යාලයේ සහකාර විගණකාධිපතිගේ අංක CPCG/KD/E/12/49/2025/12 හා 2025.12.10 දිනැති ලිපිය ප්‍රකාර ව, මෙම දෙපාර්තමේන්තුවේ සියලුම වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ තොරතුරු එම කාර්යාලය වෙත දැනුම්දිය යුතුව ඇති බැවින්, ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා ඔබ යටතේ පවතින උප ඒකකවලට අනුයුක්ත කර ඇති වාහනවලට අදාළ ලියාපදිංචි සහතික තවදුරටත් එම උප ඒකකවල පවතී නම් 2025.12.26 දිනට පෙර මා වෙත යොමු කිරීමට දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

ඩී. වත්සලා මාරඹගේ
අධ්‍යක්ෂ (පාලන)
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

ඩී.වත්සලා මාරඹගේ
අධ්‍යක්ෂ (පාලන)
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත

01. සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය - ඔබේ අංක CPCG/KD/E/12/49/2025/12 හා 2025.12.10 දිනැති ලිපිය අනුව කා.දැ.ගැ.ස.

...2/-

ඇමුණුම (03) 111

මගේ අංකය - කෘදෙ/ප/2/12(1)/15/1
පාලන 02 ශාඛාව,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය

2026.04. 30

අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන/ව්‍යාප්ති හා පුහුණු/වී පර්යේෂණ හා සංවර්ධන/බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ)

<u>රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කළ මගේ අංක කෘදෙ/ප/2/12(1)/15/1 හා 2026.04.07 දිනැති ලිපිය හා බැඳේ. (97)

02. එකී ලිපිය මඟින් ඔබ ඒකකය හා ඒ යටතේ පවතින සියලුම උප ඒකකවලට අයත් සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර අවසන් කර ඇති බව තහවුරු කරන ලෙස දැනුම් දී තිබුණ ද ඔබ ඒකකය විසින් මෙතෙක් ඒ සඳහා පිළිතුරු යොමු කර නොමැත.

03. එම තොරතුරු ජාතික විගණන උප කාර්යාලයේ සහකාර විගණකාධිපති වෙත කඩිනමින් යොමු කළ යුතුව ඇති බැවින්, ඒ සඳහා නොපමාව පිළිතුරු යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.එම්.එස්. රත්නායක
අධ්‍යක්ෂ (පාලන)
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

ආර්.එම්.එස්.රත්නායක
අධ්‍යක්ෂ (පාලන)
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත

01. සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය - ඔබේ අංක CPCG/KD/E/AD/2026/05 හා 2026.04.06 දිනැති ලිපිය අනුව කා.දැ.ගැ.ස.

(96)

ඇමුණුම 04

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்,, பேராதனை.
**Department of Agriculture, Peradeniya.**
වත්කම් කළමණාකරන ශාඛාව – வள முகாமைக் கிளை **Assets Management Branch**

| | | |
|---|---|---|
| මගේ අංකය / My No. / எனது இல : කෘ.දෙ/මු/2/වා/අප - 2026 | ඔබේ අංකය / Your No / உமது இல : | දිනය / Date / திகதி : 2026/05/04 |

ප්‍රධාන ගණකාධිකාරි / ප්‍රධාන ඉංජිනේරු / අධ්‍යක්ෂ - පාලන / සමාජ ආර්ථික හා සැලසුම් / ස්වාභාවික සම්පත් කළමනාකරණ / ව්‍යාප්ති හා පුහුණු / බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන / උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන / බීජ සහතික හා පැළෑටි සංරක්ෂණ / වී පර්යේෂණ හා සංවර්ධන / පළතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන / ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන / ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන / ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම

**<u>කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගර්හිත වාහන ලංසු කැඳවා අලෙවි කිරීම - 2026</u>**

ශිර්ෂ ගත කරුණ සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ආයතනයන්හි 2025 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වලට නතු වූ පොදු 47 ආකෘති මගින් අභාවිතව පවතින ගර්හිත වාහන අපහරණය සඳහා අප වෙත ඉදිරිපත් කර ඇත.

02. ඒ අනුව මෙම වාහන ලංසු කැඳවා අලෙවි කිරීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ගයන්ට කඩිනමින් අවතීර්ණ වී අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතු බැවින් 2025 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට නතුව ඒ අනුව පොදු 47 ආකෘති පත් මගින් ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත සඳහන් අභාවිතව පවතින ගර්හිත වාහන තව දුරටත් ඔබ ආයතනයේ හෝ ඔබ ආයතනය සතු ඒකකයන් තුල පවතිද යන්න පරික්ෂා කර බලා එම වාහන කවදා සිට ගර්හිතව පවතින්නේද යන්න පිළිබඳව ද විස්තර ඇතුලත් කර, 2026.06.01 දිනට පෙර අප වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

I. වාහන (කැබ් රථ / කාර් රථ / ලොරි රථ / ජීප් රථ / ත්‍රී රෝද රථ / යතුරු පැදි)
II. ට්‍රැක්ටර් රථ (රෝද 4 / රෝද 2 අත් ට්‍රැක්ටර් / වතුර බවුසර්)
III. කම්බයින් හාවෙස්ටර් රථ

03. තවද, වාහන ලංසු කැඳවා අලෙවි කිරීමේ ක්‍රියාදාමය මාස 06ක් වැනි කාලයක් තුල නිම කිරීමට අප විසින් කටයුතු සම්පාදනය කර ඇති බැවින් උක්ත කාල සීමාවෙන් පසුව ලැබෙන ගර්හිත වාහන 2026 වර්ෂයට අදාල වාහන අපහරණ ක්‍රියාවලියට ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති බව අවධාරණය කරන අතර මේ පිළිබඳව ඔබේ විශේෂ අවධානය යොමු කර මෙම කාර්‍යය ප්‍රමුඛත්වයෙන් සලකා උක්ත දිනට පෙර එම වාහන පිළිබඳ විස්තර අප වෙත ලබාදෙන මෙන් තවදුරටත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එන්.සෙනවිරත්න,
ප්‍රධාන ගණකාධිකාරි (වත්කම් කළමනාකරණ),
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

එස්.එම්.එන්. සෙනෙවිරත්න
ප්‍රධාන ගණකාධිකාරී (වත්කම් කළමනාකරණ)
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය


තැ.පෙ. අංක 01, පරණ ගලහ පාර, පේරාදෙණිය දු:අ:081-2388331/32/34 ෆැක්ස් : 0812388334
ප්‍රධාන ගණකාධිකාරී 0812387404 ගණකාධිකාරී (වත්කම 081 2388108

ඇමුණුම (05)

රහස්‍යයි

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

**CABINET DECISION** අමාත්‍ය මණ්ඩල තීරණය அமைச்சரவைத் தீர்மானம்

මගේ අංකය: අමප/24/1025/612/051 2024 ජුනි මස 20 දින.

පිටපත්:

ජනාධිපති ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්,
විගණකාධිපති.

ක්‍රියා කළ යුතු:

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

**කෘෂිකාර්මික ගොවිපොළ තාවකාලිකව හා**
**බීජ අලෙවි අත්තිකාරම් ගිණුමේ (28502)**
**2023 වර්ෂයේ සීමා සංශෝධනය කිරීම**

(වැඩබලන කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2024-05-29 දිනැති සංදේශය)

2024 ජුනි මස 11 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

15. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/1096/640/016 විෂයයන් අංකගත කරන ලද, ගරු ජනාධිපති සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය සහ රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සභාපතිතුමා ඉදිරිපත් කළ 2024-06-06 දිනැති සටහනට යා කොට ඇති, 2024-06-05 දින පැවැත්වුණු රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ නිර්දේශ ඇතුළත් වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලදී.

→ 2

05 (i)



එකී වාර්තාවේ ඇතුළත් ඔබ අමාත්‍යාංශයට අදාළ පහත සඳහන් නිර්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

"45.29 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/1025/612/051 වූ, "කෘෂිකාර්මික ගොවිපොළ නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමේ (28502) 2023 වර්ෂයේ සීමා සංශෝධනය කිරීම" යන මැයෙන් වැඩබලන කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ඇමතිතුමා ඉදිරිපත් කළ 2024-05-29 දිනැති සංදේශය - (අමප අංක 23/1798/612/047 පිළිබඳව වූ 2023-10-09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් සංදේශය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, එකී නිරීක්ෂණවල දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන, සංදේශයේ සඳහන් යෝජනා සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට හැකියාවක් නොමැති බව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට තීරණය කරන ලදී."

ක්‍රියා සළ යුතු: කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: ජනාධිපති ලේකම් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
අග්‍රාමාත්‍ය ලේකම් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

05(ii)

45. Report containing recommendations made by the Cabinet Sub-Committee on Public Expenditure Management at its meeting held on 2024-06-05 annexed to the Note to the Cabinet dated 2024-06-06 by the Hon. President and Minister of Finance, Economic Stabilization and National Policies and Chairman of the Cabinet Sub-Committee on Public Expenditure Management, numbered as Cabinet Paper No.24/1096/640/016 was considered by the Cabinet.

**The following recommendation pertaining to your Ministry contained in the said Report was approved by the Cabinet:**

"45.29 Cabinet Paper No.24/1025/612/051, a Memorandum dated 2024-05-29 by the Acting Minister of Agriculture and Plantation Industries on **"Revision of limits of the Agriculture Farm Maintenance and Seed Sales Advance Account (28502) for the year 2023"** - (Cabinet decision dated 2023-10-09 on CP No.23/1798/612/047 refers) the above Memorandum was considered by the Cabinet Sub-Committee along with the observations of the Minister of Finance, Economic Stabilization and National Policies. After discussion, taking into consideration the matters stated in the said observations, it was decided to recommend to the Cabinet that there is no possibility to pursue action on the proposals in the Memorandum."

Action by: **My/Agriculture and Plantation Industries** - above observations annexed.
**Director General of Agriculture** - copy of Memorandum and above observations annexed.

Copied to: **Secretary to the President** - copy of Memorandum and above observations annexed.
**Secretary to the Prime Minister** - copy of Memorandum and above observations annexed.
**My/Finance, Economic Stabilization and National Policies**

Checked by: 1. ...........
2. ...........

05(111)

PGM

(29)

# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை | The Secretariat, Colombo 01, Sri Lanka

45-29

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: MF/NB/CM/138/2024/AA/03
ඔබේ අංකය / உமது இல / Your No: CP 24/1025/612/051
දිනය / திகதி / Date: 2024.06. 03

## අමාත්‍ය මණ්ඩල සංදේශය

## මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ

| | |
|---|---|
| අමාත්‍යාංශය | : කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත |
| ශීර්ෂය හා දිනය | : කෘෂිකාර්මික ගොවිපල නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමේ (28502) 2023 වර්ෂයේ සීමා සංශෝධනය කිරීම<br>2024.05.29 |
| යෝජනා/ඉල්ලීම | : කෘෂිකාර්මික ගොවිපල නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමේ (28502) 2023 වර්ෂයේ උපරිම වියදම් සීමාවේ රැඳී සිටීමට නොහැකි වීම නිසා පහත පරිදි සීමා සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ.<br>1. උපරිම වියදම් සීමාව රු.මිලියන 950 සිට රු.මිලියන 962 දක්වා ඉහළ දැමීමටත්;<br>2. අවම ලැබීම් සීමාව උපරිම වියදම් සීමාවට අනුරූප වන ලෙස රු.මිලියන 962ක් දක්වා ඉහළ දැමීමට. |
| නිරීක්ෂණ | : කෘෂිකාර්මික ගොවිපල නඩත්තු හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුමේ (28502) 2023 වර්ෂයේ අනුමත උපරිම වියදම් සීමාවේ රැඳී සිටීමට නොහැකි වීම හේතුවෙන් මීට ප්‍රථමයෙන් උපරිම වියදම් සීමාව රු.මි.700 සිට රු.මි.950 දක්වා ඉහළ දැමීමට අංක අමප/23/1798/612/047 හා 2023.10.09 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව යෝජනාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර 2024.05.13 දිනැතිව පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගන්නා ලදී.<br>2022 අංක 43 දරන විසර්ජන පනතේ 08වන වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයට අදාලව අත්තිකාරම් ගිණුම් කටයුත්තක සීමාවන් සංශෝධනය සඳහා වූ යෝජනාවන් 2024.05.31 දිනට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. |

05(IV)

CamScanner

ඇමුණුම 06

22

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்,, பேராதனை.
**Department of Agriculture, Peradeniya.**
මුදල් අංශය. - நிதிப் பிரிவு. - Finance Division.

| | | |
|---|---|---|
| කෘදෙ/මු/8/6/2024/18 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2024.04.08 |

සියළුම අධ්‍යක්ෂවරුන්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

ප්‍රකාශන විගණනය - 2023
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - වැය ශීර්ෂ 285

ඉහත කරුණ සම්බන්ධයෙන් විගණකාධිපතිගේ අංක CPCG/KD/E/AD/A/2024/12 සහ 2024.03.27 දිනැති විගණන විමසුම හා බැදේ.

01. එක් එක් වැය විෂයන් වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැරකම් හා බැදීම් වලට එළඹිය නොහැකි වුවද , වැය විෂයන් වල ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළඹ තිබූ බව විගණයෙන් නිරීක්ෂණය වී ඇත.

02. ඒ අනුව, 2017.04.27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය සහ මුදල් රෙගුලාසි 94(1) වගන්ති ප්‍රකාරව,

- වාර්ෂික ඇස්තමේන්තු වල මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක් , සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැදී සිටීමටත්,
- ඒ වෙනුවෙන් දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවීමටත්,
- මුදල් ගෙවීමට සිදු වන කාලය වන විට අතිරේක මුදල් ප්‍රතිපාදන ලැබෙයැයි අපේක්ෂාවෙන් වියදම් හෝ බැරකම් නොදැරීමටත් , තරයේ වගබලා ගතයුතු බව මෙයින් අවධාරණය කර සිටිමි.

I. Maliy

ස්තුතියි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්
[illegible]

CIC
2024/4/8

ඇමුණුම 07

මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයශේෂ

| අනුක්‍රමික අංකය | නිලධාරියාගේ නම හා තනතුර | ණය හිඟ හිටි දිනය | නිලධාරියාට අදාළ මුළු ණය ශේෂය | අයකර ගැනීම සඳහා කටයුතු කළ ආකාරය හා වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1 | කේ.ගුණවතී - කම්කරු | 2016.05.30 | 11,550.00 | මරණ පාරිතෝෂිතය ලබා ගැනීමට යැපෙන්නන් ඉදිරිපත් නොවන බැවින් අත්තිකාරම් ගිණුමෙන් ලබාගෙන ඇති ණය ශේෂය පමණක් මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට ලිපි යොමු කර ඇත. |
| 2 | එච්.එම්.ආර්.ප්‍රේමචන්ද්‍ර - කම්කරු | 2018.09.03 | 5,000.00 | සේවා කාලය වසර 5 ක් නොමැති වීම හේතුවෙන් මරණ පාරිතෝෂිතයක් හිමි නොවන බව පසුව නිරීක්ෂණය විය. ආපදා ශේෂය ඇපකරුවන්ගෙන් අය කරගනිමින් පවතී. ඉතිරි හිඟ ණය ශේෂය රා.මු.ච.1/2020 3. (ඇ) පරිදි මු.රෙ.113 අනුව පොත් වලින් ඉවත් කර ගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතී. |
| 3 | බී.එල්.කරුණාතිලක - කම්කරු | 2020.04.16 | 45,495.00 | හිමිකරුවන්ගේ ගැටළු ඇති බැවින් මරණ පාරිතෝෂිතය සැකසීම ප්‍රමාද වී ඇති අතර පෞද්ගලික් ලිපි ගොනුව අදාල සේවා ස්ථානය වෙත අඩුපාඩු සකස් කිරීමට යවා ඇත. ඇපකරුද විශ්‍රාම ගොස් ඇති අතර ඔහු වෙත හිඟ ණය ශේෂයන් ගෙවන ලෙස දන්වා යැවීමට කටයුතු කරමින් ඇත. වැන්දඹුව විදෙස්ගතව ඇත. ඇපකරුගේ විශ්‍රාම වැටුපෙන් ණය මුදල අයකර දෙන ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. |
| 4 | එස්.එස්.සෙවනම්මා - කම්කරු | 2022.02.21 | 3,000.00 | ගොනුවේ අඩුපාඩු පවතින බැවින් මරණ පාරිතෝෂිතය සැකසීම ප්‍රමාද වී ඇත. පත්වීම ස්ථිර කිරීමේ ලිපිය ලැබී නොමැති බැවින් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. අධ්‍යාපන සහතික සනාථ කිරීමට යොමු කර ඇත. |
| 5 | එස්.එම්.ඒ.එස්. අලදෙණිය - කම්කරු | 2022.09.10 | 5,000.00 | උරුමකරුවන් ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් වී නොමැති බැවින් විශ්‍රාම ගොනුවෙහි තොරතුරු සම්පූර්ණ වී නොමැති බැවින් මරණ පාරිතෝෂිතය සැකසීම ප්‍රමාද වී ඇත. |
| 6 | වී.ජෙයකාන්තන් -වැඩ.සහකාර | 2022.09.21 | 3,750.00 | සේවය ස්ථිර කිරීමේ ගැටලුවක් පවතින බැවින් රජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් උපදෙස් ඉල්ලා ඇත. |
| 7 | කේ.ආර්.උපාලි රණසිංහ - මුරකරු | 2022.05.21 | 183,214.00 | මරණ පාරිතෝෂිකය සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. |
| එකතුව | | | 257,009.00 | |

07(i)

විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයශේෂ

| අනුක්‍රමික අංකය | නිලධාරියාගේ නම හා තනතුර | ණය හිඟ හිටි දිනය | නිලධාරියාට අදාල මුලු ණය ශේෂය | අයකර ගැනීම සඳහා කටයුතු කළ ආකාරය හා වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1 | අයි.ආර්.පද්මාවතී මැණිකේ- ක.සේ.නි. | 2021.04.30 | 29,992.00 | මෙම නිලධාරිනියගේ පුද්ගලික ලිපිගොනුව මුල්පත්වීමේ සිට යාවත්කාලීන කිරීම සඳහා යොමු කර ඇත. ඉන්පසු විශ්‍රාම පාරිතෝෂිකය සකස් කර එයින් අයවීම් අයකරගැනීමේ හැකියාව පවතී. |
| එකතුව | | | 29,992.00 | |

වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන්ගේ ණය ශේෂ

| අනුක්‍රමික අංකය | නිලධාරියාගේ නම හා තනතුර | ණය [illegible]හ [illegible]ටි දිනය | නිලධාරියාට අදාල මුලු ණය ශේෂය | අයකර ගැනීම සඳහා කටයුතු කළ ආකාරය හා වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1 | කේ.ජී.එල්.අත්තනායක - කම්කරු | 2007.04.28 | 28,800.00 | නෛතික කටයුතු සිදු වෙමින් පවතී. ඒ අනුව නීතිපති විසින් DMR 2250/16 යටතේ නඩු පවරා ඇත. |
| 2 | ඒ.එම්. ජයරත්න - කම්කරු | 2009.06.10 | 94,100.00 | ණය පියවන ලෙස දන්වා ණයකරු වෙත ලිපි යොමු කළද ප්‍රතිචාර දක්වා නොමැත. නෛතික කටයුතු සඳහා යොමු කල අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු වේ. |
| 3 | පී.එම්.පෙරේරා - | 2021.04.28 | 144,092.00 | නෛතික කටයුතු සඳහා යොමු කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු වේ. |
| 4 | එම්.ජී.එස්.ඩී.සී.කුමාරසිරි - | 2022.02.01 | 3,600.00 | නෛතික කටයුතු සඳහා යොමු කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු වේ. |
| | එකතුව | | 270,592.00 | |

07(iii)

වැටුප් සහිත නිවාඩු මත විදේශ ගතව සේවය හැර ගිය නිලධාරීන්ට අදාල ණය ශේෂ

| අනුක්‍රමික අංකය | නිලධාරියාගේ නම හා තනතුර | ණය හිඟ හිටි දිනය | නිලධාරියාට අදාල මුළු ණය ශේෂය | අයකර ගැනීම සඳහා කටයුතු කළ ආකාරය හා වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1 | ඩබ්.එම්.අයි.එස්. ගුණසේකර - පර්.නිල | 1998.11.13 | 81,370.00 | විධිමත්ව නිවාඩු අනුමතකර ගැනීමකින් තොරව විදේශගත වී ඇති බවට තොරතුරු අනාවරණය විය. අප ලිපි ගොනු වෙත ලබා දී තිබූ මෙරට ලිපිනය වෙත ණය ශේෂය පියවන ලෙසට ණයකරු වෙත ලිපි හා සිහිකැඳවීම් ලිපි යොමු කළද ඒ සඳහා ප්‍රතිචාර නොලැබුණි. මෙම නිලධාරියා උතුරුමැද පළාත් සභාවේ සිට 1997.07.01 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ස්ථානමාරු වී පැමිණ ඇති අතර මෙම ණය මුදල ස්ථාන මාරු වී පැමිණෙන විට තිබූ ණය ශේෂයක් වේ. ණයකරුගේ වර්තමාන පදිංචි ස්ථානය සොයා ගැනීම සඳහා හා වත්කම් තහවුරුකර ලබා ගැනීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතට ලිපි යොමු කරන ලදි. එම තොරතුරු අනුව ණයකරු මේ වන විටත් විදේශගත වී ඇති බවත්, ග්‍රාම නිලධාරීතුමා විසින් ණයකරු මේ පිළිබඳව දැනුවත් කර ඇති බවත්, ඉදිරියේ දී ණය ශේෂය පියවීමට කටයුතු කරනු ඇති බවත් එතුමා විසින් අප වෙත යොමු කරන ලද ලිපියෙහි සඳහන් වේ. මෙරට පදිංචි ණයකරුගේ සහෝදරයාගේ තොරතුරු ග්‍රාම නිලධාරීතුමා විසින් ලබා දී ඇති ඇති අතර ඔහු අමතා මෙම ණය මුදල පියවීමට කටයුතු කරන ලෙසට ණයකරු දැනුවත් කරන ලෙසට දන්වා ඇත. ණය මුදල ලබා දීමට අදාල ණය ගිවිසුම් ලබාදෙන ලෙස දන්වා උතුරුමැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙතද ලිපි යොමු කර ඇත. |
| 2 | ජී. බාලසූරිය - ආ.විද්‍යාඥ | 2001.04.16 | 31,309.75 | ණය කරුගේ විදෙස් ලිපිනය වෙත යොමු කළ ලිපි සඳහා යහපත් ප්‍රතිචාර දක්වා නොමැත. නෛතික කටයුතු සඳහා යොමු කිරීමට ප්‍රමාණවත් ලිපි ලේඛන නොමැත. එසේම මෙම ණයකරුගේ ඇප තැම්පතු මුදලින් රු.47,340.25 ක මුදලක් මේ වන විට අයකරගෙන ඇත. |
| | එකතුව | | 112,679.75 | |

ඇමුණුම 08

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்,. பேராதனை.
Department of Agriculture, Peradeniya.

ආර්ථික සේවා ගිණුම් ශාඛාව - பொருளாதார சேவை கணக்குக் கிளை Economic service Accounts Branch

| | | | |
|---|---|---|---|
| මගේ අංකය My No. | මු/ආර්/සේ/ගි/9/1/47 | ඔබේ අංකය Your No | දිනය Date 2026.03. |

අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
පේරාදෙණිය.

## 2026 වර්ෂයේ ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම (පලමු සිහිකැඳවීම)

උක්ත කරුණ හා බැදේ.

02. ඒ අනුව පහත නම් සඳහන් නිළධාරීන් විසින් ලබා ගෙන ඇති අදාල අත්තිකාරම් මුදල හැකි ඉක්මණින් පියවා නිරවුල් කිරීමට අවශ්‍ය වුවත් අත්තිකාරම් ලබා ගෙන මාසයකට වැඩි කාලයක් ගතවී ඇතත් මෙතෙක් නිරවුල් කිරීමට කටයුතු කර නොමැත.

03. එම අත්තිකාරම් මුදල් හැකි ඉක්මණින් පියවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

| අනු අංකය | අත්තිකාරම් ලබාගත් අයගේ නම | ලබාගත් දිනය | මුදල |
|---|---|---|---|
| 1. | එස්.ආර්.ධර්මකීර්ති මයා | 2026.01.15 | 50,000.00 |
| 2. | බී.අයි.කේ.ඩබ්.සී.මොහොට්ටි මයා | 2026.01.15 | 50,000.00 |
| 3. | බී.ඩී.රතුදුණුගේ මිය | 2026.01.16 | 100,000.00 |
| 4. | එම්.ඩී.එම්.සමරකෝන් මයා | 206.01.16 | 100,000.00 |
| 5. | එන්.එස්.වීරසූරිය මිය | 2026.01.16 | 49,833.00 |
| 6. | ජේ.පී.අයි.එස්.ජයලත් මිය | 2026.01.16<br>2026.02.15 | 85,680.00<br>97,050.00 |
| 7. | ඩී.එස්.ජේ.කහවත්තගේ මිය | 2026.01.16 | 94,500.00 |
| 8. | ඩී.එම්. අයි.එස් ගිශාන්ත මයා | 2026.01.21 | 50,000.00 |
| 9. | එම්.කේ රූබසිංහ මයා | 2026.01.29 | 15,640.00 |
| 10. | ආර්.එම්.එන්.එස් කුමාර මයා | 2026.01.29 | 13,800.00 |
| 11. | ජේ.ජේ.සී.යූ.ජයකොඩි මයා | 2026.02.04 | 50,000.00 |
| 12. | ආර්.එම්.එන්.එස්.රත්නායක මයා | 2026.02.04 | 50,000.00 |
| 13. | එම්.ජේ.ජේ.නිමල් මයා | 2026.02.09 | 50,000.00 |
| 14. | ඊ.ඩබ්.ජී.සී.කරුණාරත්න මයා | 2026.02.15 | 50,000.00 |
| 15. | කේ.පී.ආර්.එස්.ජයතිලක මයා | 2026.02.16 | 31,024.00 |


තැ.පෙ. අංක 01, පරණ ගලහ පාර, පේරාදෙණිය 081-2388331/32/34
ෆැක්ස් : 0812388149
ගණකාධිකාරි (ආ.සේ.ගි.) 081 2384137
ප්‍රධාන ගණකාධිකාරි 0812387404

08 - a

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்,, பேராதனை.
**Department of Agriculture, Peradeniya.**
ආර්ථික සේවා ගිණුම් ශාඛාව - பொருளாதார சேவை கணக்குக் கிளை **Economic service Accounts Branch**

මගේ අංකය My No. මු/ආර්/සේ/ගි/9/1/47 ඔබේ අංකය Your No දිනය Date ~~2025.11.~~

| අනු අංකය | අත්තිකාරම් ලබාගත් අයගේ නම | ලබාගත් දිනය | මුදල |
|---|---|---|---|
| 16. | ජේ.එම්.ඒ.පී.බස්නායක මයා | 2026.02.16 | 26,000.00 |
| 17. | සී.කේ.ඩී.වෙල්ලාල මයා | 2026.02.16 | 50,000.00 |
| 18. | ටී.කේ.එම්.සහබන්දු මිය | 2026.02.16 | 49,906.00 |
| 19. | බී.ඒ.පී.කුමාරි මිය | 2026.02.16 | 15,800.00 |

ගණකාධිකාරි,
ආර්ථික සේවා ගිණුම්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.


පෙ. අංක 01, පරණ ගලහ පාර, පේරාදෙණිය 081-2388331/32/34
ගණකාධිකාරි 0812387404
ෆැක්ස් : 0812388149
ගණකාධිකාරි (ආ.සේ.ගි.) 081 2384137

08-b

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்,, பேராதனை.
Department of Agriculture, Peradeniya.
ආර්ථික සේවා ගිණුම් ශාඛාව - பொருளாதார சேவை கணக்குக் கிளை Economic service Accounts Branch

මගේ අංකය / My No. : මු/9/ආර්/සේ/ගි/9

ඔබේ අංකය / Your No :

දිනය / Date : 2025.09. 10

අධ්‍යක්ෂ,

ව්‍යාප්ති හා පුහුණු.

**<u>තත්කාර්යය අතුරු අග්‍රිම පියවා ගැනීම (පළමු සිහිකැඳවීම)</u>**

උක්ත කරුණ හා බැඳේ.

02. ඒ අනුව පහත සඳහන් නිලධාරීන් ලබාගෙන ඇති අත්තිකාරම් මේ වන තෙක් පියවා නොමැති බව දන්වා සිටින අතර තත්කාර්යය අතුරු අග්‍රිම කඩිනමින් පියවීම් සිදුකළ යුතු නිසා හැකි ඉක්මනින් මෙම අත්තිකාරම් පියවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

| අනු අංකය | නිළධාරියාගේ නම | අත්තිකාරම් ලබා ගත් දිනය | මුදල |
|---|---|---|---|
| 01 | T.K.H.සහබන්දු මිය | 2025.07.22 | 49,899.00 |
| 02 | W.R.D.M.A.K.වික්‍රමසිංහ මයා | 2025.07.25 | 50,000.00 |
| 03 | P.J.M.තිලකරත්න මයා | 2025.07.30 | 50,000.00 |

ගණකාධිකාරී,

ආර්ථික සේවා ගිණුම් ශාඛාව

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

25/09/07

දු.පෙ. අංක 01, පරණ ගලහ පාර, පේරාදෙණිය 081-2388331/32/34 ෆැක්ස් : 0812388149
ප්‍රධාන ගණකාධිකාරී 0812387404 / 0759754000 ගණකාධිකාරී 081 2384137

08 - C


කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்., பேராதனை.
**Department of Agriculture, Peradeniya.**
ආර්ථික සේවා ගිණුම් ශාඛාව - பொருளாதார சேவை கணக்குக் கிளை **Economic service Accounts Branch**


| මගේ අංකය My No. | මු/ආර්/සේ/ගි/9/15 | ඔබේ අංකය Your No | | දිනය Date | 2025.07. |
|---|---|---|---|---|---|

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
ගන්නෝරුව කෘෂි තාක්ෂණ උද්‍යාන ඒකකය,
ගන්නෝරුව,
පේරාදෙණිය.

<u>**තත්කාර්ය අතුරු අග්‍රිමය පියවීම**</u>

උක්ත කරුණ සම්බන්ධව ඔබ ආයතනයේ පහත නම් සඳහන් නිලධාරීන් තත්කාර්ය අතුරු අග්‍රිමය 2025 මාර්තු හා අප්‍රේල් මාසවලදී ලබාගෙන ඇත.

02. මුදල් රෙගුලාසි ප්‍රකාරව යම් වැඩසටහනකට ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිමය අදාළ වැඩසටහන නිම වූ **"වහාම පියවීම"** සිදු කළයුතු නමුත් ඔබ විසින් ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිම මුදල් මේ වන තෙක් පියවා නොමැත.

03. එබැවින් මේ සම්බන්ධව ඔබගේ අවධානය යොමු කරමින් ලබා ගත් අතුරු අග්‍රිමයන් **වහාම** පියවීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

| නම | තත්කාර්ය ලබාගත් දිනය | මුදල |
|---|---|---|
| එල්.ජී. සුජීවා කුමාරි මිය | 2025.03.14 | 50 000.00 |
| ටී. සම්පත් සමරසිංහ මයා | 2025.04.01 | 50 000.00 |

.........................
**ගණකාධිකාරී,**
ආර්ථික සේවා ගිණුම් ශාඛාව


තැ.පෙ. අංක 01, පරණ ගලහ පාර, පේරාදෙණිය 081-2388331/32/34 ෆැක්ස් : 0812388149
ප්‍රධාන ගණකාධිකාරී 0812387404

08 - d

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம், பேராதனை
Department of Agriculture, Peradeniya.
ව්‍යාපෘති ගිණුම් ශාඛාව - கருத்திட்ட கணக்குக் கிளை - Project Accounts Branch

මගේ අංකය: කෘ.දෙ.මු/12/1/9(ප්‍රතිපාදන)    ඔබේ අංකය:    දිනය: 2023.11.30.

[redacted] / සමාජ ආර්ථික සැලසුම් මධ්‍යස්ථානය / බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නෝරුව / ජාතික කෘෂිකර්ම තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය - ගන්නෝරුව / ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - බතලගොඩ / බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශය - පේරාදෙණිය පළතුරු පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - හොරණ / උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නෝරුව

**2023 මුදල් වර්ෂය සඳහා ලබා දෙනු ලැබූ අත්තිකාරම් (සත්කාර්ය හා අතුරු අග්‍රිම) පියවීම**

ඔබ අංශ යටතේ 2023 වර්ෂයේ ක්‍රියාත්මක වන වී ඇතුළු අතිරේක ආහාර බෝග 13 ඇතුළු අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා සහ GAP ව්‍යාපෘතිය සඳහා මෙම ශාඛාව මඟින් නිකුත් කරන ලද අත්තිකාරම් මුදල් සම්බන්ධවයි.

02. 2023 ජනවාරි සිට මේ දක්වා ඔබ අංශයේ නිලධාරීන් විසින් ලබා ගන්නා ලද නමුත්, මෙතෙක් පියවා නොමැති සත්කාර්ය හා අතුරු අග්‍රිම අත්තිකාරම් මේ වන විටත් වියදම් කර අවසන් නම්, වර්ෂය අවසානය වන තෙක් නොසිට අදාල පියවීම සිදු කර ගන්නේ නම්, වර්ෂ අවසාන ගිණුම් පියවීමේ කටයුතු වලට පහසුවක් වනු ඇත. එමෙන්ම අත්තිකාරම් මුදලින් වියදම් නොකර ඉතිරි වන මුදල් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ බැ.අ. 057-100119027184 වෙත බැර කර, හෝ සරප් වශයෙන් ලබා ගන්නා ලද අංක 172 ආකෘතිය මුල් පිටපත අදාල වවුචරය සමඟ අමුණා ඉදිරිපත් කරන ලෙස ද කාරුණිකව දන්වමි.

03. එබැවින් මේ සම්බන්ධයෙන් අදාල ශාඛා කාර්යාල දැනුවත් කර, 2023 ඔක්තෝබර් මස 31 දින තෙක් ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල් පිළිබඳ පසු විපරම් කටයුතු කර, පියවීමේ හැකියාවක් ඇත්නම් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසට මෙයින් ඉල්ලමි.

04. ඔබගේ දැන ගැනීම පිණිස මේ සමඟ අමුණා ඇති ANNEX ~~01~~ (01-12 දක්වා) ආකෘතියේ නම් සඳහන් නිලධාරීන් විසින් ලබා ගත් අත්තිකාරම් පියවීමට ඇති බව වැඩි දුරටත් සඳහන් කරන අතර, මෙම ලිපිය ලැබෙන දිනය වන විට අදාල නිලධාරීන් විසින් එම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත්නම්, මෙම ලිපිය නොසලකා හරින ලෙස ද වැඩිදුරටත් සඳහන් කරමි.

ගණකාධිකාරී
ව්‍යාපෘති ගිණුම් අංශය

ඩබ්.සී.අයි. වෙදගෙදර
ගණකාධිකාරී
ව්‍යාපෘති ගිණුම් ශාඛාව
[illegible] ජනරාල් වෙනුවට

O/C

තැ.පෙ. අංක 01, පරණ ගලහ පාර, පේරාදෙණිය 081-2388331/32/34
ප්‍රධාන ගණකාධිකාරී 0812387404 / 0759754000
ගණකාධිකාරී(ව්‍යාපෘති ගිණුම්) 081 2384472

08-ළ

මගේ අංකය:- කෘ.දෙ.මූ.12/1/05

ව්‍යාපෘති ගිණුම් අංශය,

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,

පේරාදෙණිය .

2024.12. 03

අධ්‍යක්ෂ(ව්‍යාප්ති හා පුහුණු)

ව්‍යාප්ති හා පුහුණු අංශය.

<u>2024 මුදල් වර්ෂය සඳහා ලබා දෙන ලද අත්තිකාරම් පියවීම සම්බන්ධවයි</u>

ඔබ ඒකකය යටතේ 2024 වර්ෂයේ ක්‍රියාත්මක වන ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා හා වෙනත් වැඩසටහන් සඳහා මෙම ශාඛාව මගින් නිකුත් කරන ලද අත්තිකාරම් මුදල් සම්බන්ධවයි.

02. ඒ අනුව, 2024 වර්ෂයේ ඔබ ඒකකයට අදාල නිළධාරීන් විසින් ලබා ගන්නා ලද නමුත්, මෙතෙක් පියවා නොමැති අත්තිකාරම් මේ වන විට වියදම් කර අවසන් නම්, වර්ෂය අවසානය වන තෙක් නොසිට අදාල පියවීම සිදු කිරීම තුලින් වර්ෂ අවසාන ගිණුම් පියවීමේ කටයුතු වලට පහසුවක් වනු ඇත.

03. එබැවින්, 2024 නොවැම්බර් මස 30 දින තෙක් ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල් (සුළු මුදල් ~~සහ~~ සහ වෙනත් විශේෂ කාර්යයක් සඳහා ලබා ලත්නා ලද අත්තිකාරම්) පිළිබඳ පසු විපරම් කටයුතු කර, පියවීමේ හැකියාවක් ඇති අත්තිකාරම් මුදල් 2024.12.20 දිනට පෙර පියවීම සඳහා වවුචර් ඉදිරිපත් කරන ලෙස අදාල ශාඛා කාර්යාල /ඒකක සහා කාර්යාල දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

04. ඔබගේ දැන ගැනීම පිණිස පියවීමට ඇති අත්තිකාරම් ලබා ගත් නිලධාරීන්ගේ නම මෙ සමඟ ඉදිරිපත් කරන අතර, මෙම ලිපිය ලැබෙන දිනය වන විට අදාල නිළධාරීන් විසින් එම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත්නම්, එය නොසලකා හරින ලෙස ද කාරුණිකව සඳහන් කරමි.

ඩබ්.සී.අයි. වෙදගෙදර
ගණකාධිකාරී
ව්‍යාපෘති ගිණුම් ශාඛාව
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

ඩබ්.සී.අයි.වෙදගෙදර
ගණකාධිකාරී
ව්‍යාපෘති ගිණුම් ශාඛාව.

OIC


| | | | | | |
|---|---|---|---|---|---|
| අතිරේක අධ්‍යක්ෂ [illegible] | 081-2388696 | ඊ-මේල්<br>ஈமெயில்<br>E-mail | pmeu@doa.gov.lk<br>dd.pmeu@doa.gov.lk | ෆැක්ස් අංකය<br>.பெக்ஸ்<br>Fax | 081-2388696<br>081-2388136 |

08-F (61)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்,, பேராதனை.
**Department of Agriculture, Peradeniya.**
ව්‍යාපෘති ගිණුම් ශාඛාව – கருத்திட்ட கணக்குக் கிளை - **Project Accounts Branch**

මගේ අංකය } කෘදෙ/මු/12/1/5 ඔබේ අංකය } දිනය } 2025.09. 25

අධ්‍යක්ෂ - ව්‍යාප්ති හා පුහුණු අංශය / උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන / වී පර්යේෂණ හා සංවර්ධන / ස්වාභාවික සම්පත් හා කළමනාකරණ/ පළතුරු පර්යේෂණ හා සංවර්ධන

**<u>2025 මුදල් වර්ෂය සඳහා ලබා දෙනු ලැබූ තත්කාර්යය අත්තිකාරම් පියවීම</u>**

ඔබ ඒකකය යටතේ 2025 වර්ෂයේ ක්‍රියාත්මක වන 118 අමාත්‍යාංශ වැය ශීර්ෂය, 285 වැය ශීර්ෂය(බෝග 13 වැඩසටහන) සහ වෙනත් ව්‍යාපෘති එනම් NARP, CLIMATE, HYBRID, SOIL ACT යන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා මෙම ශාඛාව මඟින් මේ වන විට විශාල අත්තිකාරම් ප්‍රමාණයක් නිකුත් කර ඇත.

02. යම් වැඩසටහනක් වෙනුවෙන් ලබා ගන්නා ලද අත්තිකාරම් අදාල වැඩසටහන නිමවූ වහාම/ නිම වී දින 10ක් ඇතුලත පියවීම කළ යුතු නමුත්, 2025 ජනවාරි සිට 2025.07.31 දක්වා ඔබ ඒකකය යටතේ සේවය කරන නිලධාරීන් විසින් විවිධ වැඩසටහන් සඳහා ලබා ගන්නා ලද ඇතැම් අත්තිකාරම් මුදල් මේ වන තෙක් පියවා නොමැති බව නිරීක්ෂණය වේ.

03. එබැවින්, මේ සම්බන්ධයෙන් අදාල ශාඛා කාර්යාල දැනුවත් කර 2025 ජනවාරි මාසයේ සිට 2025 ජුලි මස 31 දින තෙක් ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල් (සුළු මුදල් හැර අනෙකුත් විශේෂ කාර්යයන් සඳහා ලබා ගන්නා ලද අත්තිකාරම්) පිළිබඳ පසු විපරම් කටයුතු කර, අදාල පියවීමේ කටයුතු කඩිනමින් සිදු කරන ලෙසට නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.( ඇමුණුම 01) එමෙන්ම, මෙම ලිපිය ලැබෙන දිනය වන විට එම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත්නම්, මෙම ලිපිය නොසලකා හරින ලෙස ද කාරුණිකව සඳහන් කරමි.

04.තවද, 2025.07.31 දින සිට මේ දක්වා විවිධ වැඩසටහන් සඳහා ලබා ගත් අත්තිකාරම් වෙතොත් අදාල වැඩසටහන් නිම වූ වහාම පියවීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.සී.අයි.වෙදගෙදර
ගණකාධිකාරී
ව්‍යාපෘති ගිණුම් ශාඛාව.

O/C

තැ.පෙ. අංක 01, පරණ ගලහ පාර, පේරාදෙණිය 081-2388331/32/34
ප්‍රධාන ගණකාධිකාරී 0812387404 / 0759754000 ගණකාධිකාරී(ව්‍යාපෘති ගිණුම්) 081 2384472

08-9

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
விவசாயத் திணைக்களம்,, பேராதனை.
**Department of Agriculture, Peradeniya.**
ව්‍යාපෘති ගිණුම් ශාඛාව – கருத்திட்ட கணக்குக் கிளை - **Project Accounts Branch**

මගේ අංකය } කෘදෙ/මු/12/1/5 ඔබේ අංකය } දිනය } 2025.11.14

අධ්‍යක්ෂ(ව්‍යාප්ති හා පුහුණු අංශය / තොරතුරු හා සංනිවේදන / ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන / පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන / උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන / බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන / බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ සේවය),

**2025 මුදල් වර්ෂය සඳහා ලබා දෙනු ලැබූ තත්කාර්යය අත්තිකාරම් පියවීම**

ඔබ ඒකකය යටතේ 2025 වර්ෂයේ ක්‍රියාත්මක වන 118 අමාත්‍යාංශ වැය ශීර්ෂය, 285 වැය ශීර්ෂය(බෝග 13 වැඩසටහන) සහ වෙනත් ව්‍යාපෘති එනම් NARP, CLIMATE, HYBRID, SOIL ACT යන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා මෙම ශාඛාව මගින් මේ වන විට විශාල අත්තිකාරම් ප්‍රමාණයක් නිකුත් කර ඇත.

02. යම් වැඩසටහනක් වෙනුවෙන් ලබා ගන්නා ලද අත්තිකාරම් අදාල වැඩසටහන නිමවූ වහාම/ නිම වී දින 10ක් ඇතුලත පියවීම කළ යුතු නමුත්, 2025 වර්ෂයේ මේ දක්වා ඔබ ඒකකය යටතේ සේවය කරන නිළධාරීන් විසින් විවිධ වැඩසටහන් සඳහා ලබා ගන්නා ලද ඇතැම් අත්තිකාරම් මුදල් මේ වන තෙක් පියවා නොමැති බව නිරීක්ෂණය වේ.

03. එබැවින්, මේ සම්බන්ධයෙන් අදාල ශාඛා කාර්යාල දැනුවත් කර 2025 වර්ෂයේ මේ දක්වා ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල් (සුළු මුදල් හැර වෙනත් විශේෂ කාර්යයක් සඳහා ලබා ලන්නා ලද අත්තිකාරම්) පිළිබඳ පසු විපරම කටයුතු කර, අදාල පියවීමේ කටයුතු කඩිනමින් සිදු කරන ලෙසට නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.( ඇමුණුම) එමෙන්ම, මෙම ලිපිය ලැබෙන දිනය වන විට එම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත්නම්, මෙම ලිපිය නොසලකා හරින ලෙස ද කාරුණිකව සඳහන් කරමි.

04.එමෙන්ම, වසර අවසාන ගිණුම් පියවීමට ආසන්න බැවින් ඉදිරි දිනයන්හි විවිධ වැඩසටහන් සඳහා අත්තිකාරම් ලබා ගන්නේ නම් අදාල වැඩසටහන් නිම වූ වහාම පියවීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.සී.අයි.වෙදගෙදර
ගණකාධිකාරී
ව්‍යාපෘති ගිණුම් ශාඛාව.

OIC


මු.පෙ. අංක 01, පරණ ගලහ පාර, පේරාදෙණිය 081-2388331/32/34

ප්‍රධාන ගණකාධිකාරී 0812387404 ගණකාධිකාරී(ව්‍යාපෘති ගිණුම්) 081 2384472